# වසරක කාර්ය සාධනය

2022 අගෝස්තු සිට 2023 ජූනි දක්වා



**බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලය,**

**වේයන්ගොඩ**

# කාර්ය ප්‍රගතිය 2020 – 2022

සුවිශේෂී අධ්‍යාපන ජයග්‍රහණ රැසක් සමගින් රටට උගත්, විනයවත්, දක්ෂතාවයෙන් පිරිපුන් පුරවැසියන් දායාද කරන වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලය 2020 වසර ඇරඹුමත් සමඟින් කිසියම් සංක්‍රාන්ති සමයක් වෙත එළැඹුනු බව කිව යුතුය. හිටපු විදුහල්පති එස්.ඒ.එල්.බී.සිරිමාන්න මහතා 2020 ජනවාරි මස විශ්‍රාම ගැනීමත් සමගම විදුහල්පති ධූරයේ වැඩබැලීම සඳහා පත් වූ එච්.ඒ.ඩබ්.කේ.හේරත් මහතාට බාරදූර කාර්යයන් රැසකට නායකත්වය ලබා දෙන්නට සිදු විය. නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු මස සිට පාසල් වසා දමා ජාතික අධ්‍යාපන පද්ධතියෙහි සිදු වූ වෙනස්කම් සඳහා මුහුණ දෙමින් අධ්‍යාපන ක්‍රියාවලිය දුරස්ථව හෝ පවත්වා ගැනීමට පාසල් නියෝජ්‍ය විදුහල්පතිවරුන් ඇතුලු කාර්ය මණ්ඩලය කටයුතු කරන ලදී. ඒහි ප්‍රතිපලයක් ලෙස 2021 අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ විභාගවලින් ඉහළ ප්‍රතිපල සාක්ෂාත් කර ගැනීමට පාසල සමත් විය.

2020 වසරේ සිට 2022 ජූලි මස දක්වා කාලය තුළ අභියෝග රැසක් මධ්‍යයේ වුව ද පාසලෙහි අධ්‍යාපන ක්‍රියාවලිය නිසි පරිදි පවත්වා ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් හා වැඩසටහන් පාසල විසින් ක්‍රියාවට නංවා තිබේ.

- 2020, 2021 වර්ෂයන්හි දී 6- 13 ශ්‍රේණි පන්ති සඳහා විධිමත් කාල සටහනකට අනුව මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කිරීම.
- 2021 කොවිඩ් මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ සිසුන් සහ ගුරුභවතුන් සඳහා පළමු, දෙවන හා තෙවන එන්නත්කරණ ක්‍රියාවලිය සිදුකිරීම.
- 2021 වෙසක් සහ පොසොන් වැඩසටහන් ශ්‍රේණි මට්ටමින් මාර්ගගත ක්‍රමයට සිදුකිරීම.
- සුහුරු පන්ති කාමර සඳහා වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම.
- තාක්ෂණික පීඨ යාන්ත්‍රික තාක්ෂණ  කාමරය සඳහා ජනෙල් ග්‍රිල් සැකසීම.
- තාක්ෂණික පීඨ කෘෂිකාර්මික පොලිතීන් ගෘහය අලුත්වැඩියා කිරීම.
- 6, 7 ශ්‍රේණිවල පන්ති කාමර සඳහා රූපවාහිනී යන්ත්‍ර සවිකර දීම.
- පාසල් පරිශ්‍රයෙහි ඇති වැවෙහි කැඩී ගිය සොරොව්ව අලුත්වැඩියා කිරීම.
- මාර්ගගත ක්‍රමයට හා සාමාන්‍ය ක්‍රමයට දුරස්ථ අධ්‍යාපනික වාර විභාග පැවැත්වීම.
- ආර්ථික අපහසුතා ඇති සිසුන් උදෙසා සුහුරු ජංගම දුරකතන (Smart phone) හා අන්තර්ජාල පහසුකම් ප්‍රදානය කිරීම.
- පාසලේ ප්‍රධාන ගොඩනැගිලිවල වහල හා පීලි ප්‍රතිසංස්කරණය
- පාසල ඉදිරිපස බණ්ඩාරනායක මාවත පාර ප්‍රතිසංස්කරණය කිරීම ඇරඹීම
- ප්‍රධාන ආපන ශාලාව නවීකරණය ආරම්භ කිරීම
- ක්‍රීඩාංගනයේ තණකොළ කපන අලුත් යන්ත්‍රයක් ආදි ශිෂ්‍ය සංගමය විසින් ලබා දීම
- උසස් පෙළ සිසුන් සඳහා ක්‍රීඩා තරඟ පැවැත්වීම
- ශිෂ්‍ය නායක නිල ලාංඡන පැලඳවීම උත්සවාකාරයෙන් සිදු කිරීම

ඉහත දැක්වෙන කාර්යයන් පාසල කඩින් කඩ වසා තිබූ අවධියක පැවති අපහසුතා හා අභියෝග රාශියක් මධ්‍යයේ සිදු කළ වැඩසටහන් බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ එච්.ඒ.ඩබ්.කේ.හේරත් මහත්මා, පී.එල් සැම්සන් මහත්මා ඇතුලු නියෝජ්‍ය විදුහල්පතිවරුන්ටත් අනිකුත් කාර්ය මණ්ඩලයටත් ප්‍රශංසාව හිමි විය යුතුය.

## 2022 ජූලි මස 25 සිට නැවත පාසල් විවෘත කිරීමෙන් පසු....

කොවිඩ් වසංගත තත්ත්වය යම්තාක් දුරකට පාලනය වීමත් සමගම පාසල් යලි විවෘත කිරීමට කටයුතු කළ ද එවකට රටේ පැවති ඉන්ධන හිඟය හා ප්‍රවාහන ගැටලුව හේතුවෙන් පාසල් කාර්ය මණ්ඩලය පැමිණීම සීමා වී තිබිණි. පාසල් ක්‍රියාවලිය මුළුමුණින්ම නැවත මුලසිට ආරම්භ කිරීමට අවශ්‍ය තත්ත්වයක් පැවතුනි.

මෙවැනි වකවානුවක 2022 ජූලි මස 22 දින ඩී.එච්.එස්.ඩී.සෝමරත්න මහත්මා නව විදුහල්පති ලෙස පාසලේ රාජකාරී භාර ගන්නා ලදී.

නව විදුහල්පතිතුමාගේ ප්‍රථම රාජකාරිය ලෙස 2021 ශිෂ්‍යත්ව විභාගයෙන් පාසලට තේරී පත්වූ සිසුන් භාර ගැනීම 2022 ජූලි මස 25 දින සිදු කරන ලදී. පාසලෙහි වැඩබැලූ විදුහල්පති හේරත් මහතා ඇතුලු කාර්ය මණ්ඩලය මේ සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කර තිබුණි. එමෙන්ම අනුග්‍රාහක පදනම් මත 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිපල මත සිසුන් ඇතුලත් කර ගැනිම සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ ද ඒ වන විට පවත්වා අවසන් කර තිබුණි.

පාසල කාලයක් වසා දමා තිබීමත්, නිලධාරීන් ස්ථානමාරු ලැබ සිටීමත් නිසා 2020 දක්වා පැවතුණු පාසල් සංස්කෘතික වටපිටාව හා සම්ප්‍රදාය තරමක් දුරට බිඳ වැටී තිබුණු බැවින් පාසලෙහි අධ්‍යාපන කටයුතුවලට සමගාමීව අනිකුත් ක්‍රියාදාමයන් මුලසිටම ඇරඹීමට සිදු විය. විශේෂයෙන් වසර දෙකයි මාස හයක් තරම් කාලයක් සුදුසුකම්ලත් විදුහල්පතිවරයෙකු නොමැති වීම මත පාසලේ කළමනාකරණ ක්‍රියාවලිය තුළ කාර්යාල කටයුතු තරමක් දුරට අවිධිමත් තත්ත්වයකට පත්ව පැවතුනි. මේ නිසා කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා පියවර ගැනීම මුලින්ම සිදු කරන ලදී.

දිගු කලක් නිවසෙහි ගතකිරීම සහ සුහුරු දුරකතන වැනි උපාංගයන්ට හුරු වුණු සිසුන්ගේ විනය සහ අධ්‍යාපනය සඳහා යොමුකරවීම සම්බන්ධයෙන් විශාල අභියෝගයක් පැවතුනි. එබැවින් පන්ති කාමරය තුළට සීමාකර ඉගැන්වීම් පමණක් සිදු කිරීම වෙනුවට සිසුන් විවිධ විෂය සමගාමී හා ක්‍රීඩා කටයුතු සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදී. අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා ද විශේෂ අවධානයක් යොමු කරමින් සිසුන්ගෙන් ගිලිහී යමින් තිබූ උනන්දුව අධ්‍යාපන කටයුතු සඳහා යොමුකර ගැනීමට උපක්‍රමිකව කටයුතු කිරීමට සිදු විය.

ඒ අනුව 2022 අගෝස්තු මාසයේ සිට විවිධ වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කරන ලදී.

මෙසේ අවස්ථානුකූලව ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

- පරිපාලන හා කළමනාකරණ කටයුතු
- විෂය සමගාමී හා සාරධර්ම ප්‍රවර්ධන කටයුතු
- ක්‍රීඩා කටයුතු
- අධ්‍යාපන සංවර්ධනය හා ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම
- ශිෂ්‍ය සුබසාධන කටයුතු
- ගුරු හා කාර්ය මණ්ඩල සුබසාධන කටයුතු
- භෞතික සම්පත් සංවර්ධනය
- ප්‍රජා සබඳතා

## පරිපාලන හා කළමනාකරණ කටයුතු

1. **සියලුම කාර්ය මණ්ඩලය සඳහා විධිමත් රාජකාරී පැවරීම් සිදු කිරීම හා වැඩ අධීක්ෂණ ක්‍රියාවලියක් සකස් කිරීම**
   නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට, සහකාර විදුහල්පතිවරුන්ට, අංශ ප්‍රධානීන්ට, ශ්‍රේණි ප්‍රධානීන්ට හා ක්‍රීඩා, විෂය සමගාමී කටයුතු භාර ගුරුභවතුන්ට නිසි පරිදි රාජකාරි පැවරුම් ලිපි නිකුත් කරන ලදී. තව ද සංවර්ධන නිලධාරින්ගේ ප්‍රවීණතා හා හැකියා විමසීම් කර පාසලේ විවිධ කාර්යයන්වල වගකීම් මෙන්ම කණිෂ්ඨ කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා ද වගකීම් පවරණ ලදී.

2. **අවශ්‍යතාව අනුව නව පත්කිරීම් හා රාජකාරී බෙදාදීම් සිදු කිරීම**
   6 -11 ශ්‍රේණිවල වැඩි ශිෂ්‍ය පිරිසක් නියෝජනය වීමත් ඒ අතර බාලිකාවන් වැඩි පිරිසක් සිටින නිසාත් එම අංශයේ සහකාර විදුහල්පතිනිය ලෙස චන්දිමා ජයතිලක මහත්මිය පත්කරන ලදී. විෂය සමගාමී කටයුතු හා සාරධර්ම සංවර්ධනයට අදාළව ප්‍රධාන ගුරුභවතුන් පත් කළ අතර පාසලෙහි එම කාර්යයන් වඩාත් ඵලදායී ලෙස සිදු කිරීමට පහසුකම් සළසා දෙන ලදී.

3. **පාසලේ මූල්‍ය උපයෝජන පිලිවෙත සකස් කිරීම හා වියදම් / මිල සීමා අනුමත කර ගැනීම**
   පාසලට අදාළ මුදල් වියදම් සීමා සකස් කර නොතිබුණු නිසා අධ්‍යාපන අමාත්‍යාංශ වැඩමුළු හා කාර්ය වෙනුවෙන් කරන ගෙවීම්වලට අදාළ සීමා පදනම්ව හා 2018/26 චක්‍රලේඛයට යටත්ව පාසල් සංවර්ධන කමිටු නිර්දේශ අනුව පාසලට සුදුසු ලෙස ආහාර පාන, ප්‍රවාහන, කාර්ය මණ්ඩල, උපදේශන ගෙවීම් සීමා අනුමත කර ගන්නා ලදී.

4. **කාර්යාල ක්‍රම විධිමත් කිරිම සඳහා කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය**
   සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකුගේ සම්පත්දායකත්වය යටතේ මෙම වැඩසටහන 2022 අගෝස්තු මාසයේ දි පැවැත්වූ අතර මෙයට පෙර පාසල තුළ එවැනි ධාරිතා සංවර්ධන වැඩසටහනක් සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලය යොමු කර නොතිබුණි.





**5. කාර්යාල ලිපිගොනු පද්ධතිය සකස් කර කාර්යාල ක්‍රියාවලිය විධිමත් කිරීම**

කාර්යාල ලිපිලේඛන සම්බන්ධ රාජකාරී සිදු වීමේ දී කාර්යාල ක්‍රමවේදවලට අනුකූල වන ලිපිගොනු පරිහරණ ක්‍රමයක් නොතිබුණි. එබැවින් එක් එක් විෂයයන්ට අදාළ ලිපිගොනු හඳුනාගෙන ඒ අනුව වර්ණ කේත ක්‍රම සහිත ලිපිගොනු පද්ධතියක් සකස් කරන ලදී. කාර්ය මණ්ඩලය දැනුවත් කර මෙම ක්‍රියාවලිය ඇරඹීමෙන් පසු සෑම කරුණක්ම අදාළ ලිපිගොනු හරහා ඉදිරිපත් කිරීමේ සංස්කෘතියක් ඇති කිරීමට කටයුතු කරක ලදී.




**6. පාසල් අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය බලගැන්වීම**

ඇගයීම් ක්ෂේත්‍ර අනුව ගුරුභවතුන් වෙන්කර අභ්‍යන්තර ඇගයීම් ක්‍රමය නැවත පාසල තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. මෙහි දී ගුරුවරුන් ඇගයීම් සඳහා වඩාත් පහසු ආකෘතියක් සකස් කර හඳුන්වා දෙන ලදී. ශිෂ්‍ය සාධනය ඇතුළු අනිකුත් ඇගයීම් ක්ෂේත්‍රවල ද නිර්ණායක හා දර්ශක පාසලට ගැලපෙන ලෙස සකස් කිරීමට කටයුතු කරන ලදී.

## විෂය සමගාමී හා සාරධර්ම ප්‍රවර්ධන කටයුතු

**7. ශිෂ්‍ය නායක නායිකාවන් පුහුණු කිරීම**

2022 – 2023 වසර සඳහා පත් කරන ලද ශිෂ්‍ය නායකයන් සඳහා පෞරුෂ සංවර්ධන දෙදින වැඩසටහනක් අත්තනගල්ල ජාතික යොවුන් සේනාංක සම්පත්දායකත්වයෙන් පවත්වන ලදී. එම ශිෂ්‍ය නායක කණ්ඩායම සඳහා නැවතත් 2023 වර්ෂයේ දී එක් දින පුහුණු වැඩසටහනක් පාසල් පරිශ්‍රයේ දී පවත්වන ලදී.





**8.** **ශිෂ්‍ය භට බටහිර තූර්ය වාදන බණ්ඩයට අවශ්‍ය භාණ්ඩ හා නිල ඇඳුම් උපාංග සපයා දීම**

**9.** **ශිෂ්‍ය භට තූර්ය වාදන බණ්ඩය කඳවුරුගත වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා සේවා සපයා ගැනීමට අවශ්‍ය මූල්‍යාධාර සැපයීම**

රන්ටැඹේ ජාතික ශිෂ්‍ය භට බලකා මූලස්ථානයේ කඳවුරු ගත වීම සඳහා පාසලේ බාලක බටහිර ශිෂ්‍ය භට තූර්ය වාදක කණ්ඩායමට අවශ්‍ය සංගීත භාණ්ඩ අලුත්වැඩියා කර දීම හා අවශ්‍ය ඇඳුම් සකස් කර දීම සිදු කරන ලදී. එම තරඟාවලියෙන් 2022 වසරේ සමස්ත ලංකා සිව්වන ස්ථානය දිනා ගැනීමට අප පාසලේ ශිෂ්‍ය භට තූර්ය වාදක කණ්ඩායම සමත් විය.



**10.** **ලෝක ළමා දිනය නව මුහුණුවරකින් පැවැත්වීම**

ලෝක ළමා දින වැඩසටහන තුළ කෙටි චිත්‍රපටයක් පෙන්වීම, රසවින්දන වැඩසටහන් පැවැත්වීම, සරුංගල් යැවීම, නිදහස් නර්තනය ආදි වූ අංග සංවිධානය කොට සිසුන්ට ප්‍රබෝධමත්ව හා ආකර්ශනීය ලෙස ළමා දිනය සැමරීමට අවස්ථාව ලබා දෙන ලදී.







**11.** **ලෝක ගුරු දිනය අභිමානවත්ව සැමරීම**




**12.** **කලා සංගමය, මාධ්‍ය සංසදය, විද්‍යා සංගමය, තාරකා විද්‍යා සංගමය ආදී සමිති, සංගම් නැවත පත්කිරීම හා කාර්ය පවත්වා ගැනීම**

අක්‍රීය තත්ත්වයේ පැවති සංගම්, සමාජ කිහිපයක්ම සිසුන් හා ගුරුභවතුන් ඒකරාශී කර විධිමත් පරිදි නැවත ආරම්භ කර ඉදිරි කාර්යයන් පවරා දෙන ලදී. එමගින් කලා උළෙල, තරු කඳවුර, නව මාධ්‍ය පුහුණුවීම්, විවාද තරඟ පැවැත්වීම වැනි වැඩසටහන් සඳහා සිසුන් යොමු කරන ලදී.

**13.** **පාසලෙහි අක්‍රීයව පැවති බාලදක්ෂ ක්‍රියාකාරකම් සිසුන් සඳහා ආරම්භ කිරීම**

බාලදක්ෂ කටයුතු සඳහා සුදුසුකම්ලත් ගුරුවරයෙකු නොමැතිකම කාලයක් ම ගැටලුවක්ව පැවතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයට ඉල්ලීම් කර ඊට සුදුසු ගුරුභවතෙකු පාසලට ස්ථානමාරු කර ගනිමින් නැවත බාලදක්ෂ කටයුතු ආරම්භ කළ හැකි වීම විශාල ජයග්‍රහණයකි.

**14.** **සිසු අධ්‍යාපන චාරිකා සංවිධානය**

වසර කිහිපයකට පසුව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද අවසරය මත අධ්‍යාපන චාරිකා සඳහා සිසුන් රැගෙන ගිය අතර ඒවා වඩාත් ඵලදායීව හා ආරක්ෂිතව සිදු කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලදී.

**15.** **සමූපාකාර සමාජය පිහිටුවීම හා සමූපාකාර පොත්හල ආරම්භ කිරීමට කටයුතු කිරීම**



වසර තුනකට ආසන්න කාලයක් අක්‍රිය තත්ත්වයේ පැවති සමූපාකාර පොත්හල නැවත 2022.10.03 දින විවෘත කර වගකීම් පවරා සිසු අයිතියට පත් කරන ලදී. 9 ශ්‍රේණියේ සිසුන්ට සමූපාකාර සමාජය හා පොත්හල පවත්වාගෙන යාමට අවස්ථාව සළසන ලදී.

**16.** **රාත්‍රී තරු කඳවුර පැවැත්වීම**



විද්‍යා ගුරුභවත් විසින් සංවිධානය කළ මෙම තරු කඳවුර 2023.01.13 දින සවස සිට පසුදා පෙරවරුව දක්වා පැවැත්විය. ඒ සඳහා 8, 9, 10 සහ 11 සිසුන් සහභාගී කර ගත් අතර දෙමාපිය සහයෝගය ද මෙයට ලැබුණි.

**17.** **පාසල් සිසු පොල පැවැත්වීම**




කොරෝනා වසංගත කාලය තුළ පැවැත්වීමට නොහැකි වූ සිසු පොළ 2022.12.21 දින පාසල් පරිශ්‍රයේ දී පැවැත්වූ අතර වෙළඳ කුටි 65ක් පමණ ක්‍රියාත්මක විය. පාසලේ මූල්‍ය තත්ත්වය පහළ මට්ටමක පැවති අවස්ථාවක මෙම සිසු පොල හරහා ලක්ෂ 20කට වැඩි මුදලක් උපයා ගැනීමට හැකියාව ලැබුණි.

**18.** **මාර්ග ආරක්ෂාව හා රිය නියාමක සිසුන් සඳහා පලදනා සහ සහතිකපත් ලබා දිමේ වැඩසටහන**

වේයන්ගොඩ පොලීසිය, නුංගමුව පොලිසිය සමග ඒකාබද්ධව සංවිධානය කළ ගම්පහ පොලිස් කොට්ඨාස සහකාර පොලිස් අධිකාරී සහභාගි වූ මාර්ග ආරක්ෂාව හා රිය නියාමක සිසුන්ට සහතික පත් පිරිනැමීම 2022.10.18 දින පාසලේ සත්කාරකත්වයෙන් පැවැත්වීය. මේ සඳහා අවට පාසල්වල සිසුහු හා ගුරුවරු ද සහභාගි වූහ.

**19.** **උසස් පෙළ විද්‍යා අංශයේ සිසුන් සඳහා පැවැත්වූ විශේෂ පෞරුෂ සංවර්ධන වැඩසටහන**

උසස් පෙළ විද්‍යාව හදාරණ සිසුන්ට ඉංග්‍රීසි භාෂාව පදනම් කරගත් විශේෂ ක්‍රියාකාරකම් වැඩසටහන 'BOOST' නමින් 2022.11.21 දින පවත්වන ලදී. මේ සඳහා විශේෂ ආරාධිතයෙකු ලෙස 7 වන ශිෂ්‍ය භට බලකායේ අණදෙන නිලධාරි සහභාගි විය.

**20.** **පාසල් විවාද සංසදයේ සංවිධාන ශක්තියෙන් 'වාදාභිෂේක' විවාද තරගාවලිය පැවැත්වීම**

පාසල් විවාද සංසදයේ හා ආදි සිසුන්ගේ සංවිධානයෙන් මාර්ගගත ලෙස පාසල් 45කට වැඩි ප්‍රමාණයක් සහභාගී කර ගනිමින් සිදු කළ මෙම වැඩසටහනෙහි අවසන් තරඟ 2022.12.04 දින පාසලේ දී පැවැත්වූ අතර අවසන් මහා තරඟයෙන් කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය පරදා කොළඹ රාජකීය විද්‍යාලයේ විවාද කණ්ඩායම ජය ලැබීය.





**21.** **ශිෂ්‍ය භට හා ශිෂ්‍ය භටවියන් සඳහා අවශ්‍ය ඇඳුම් ආයිත්තම් සකස් කර දීම**

ශිෂ්‍ය භටවියන් සඳහා පුහුණු ආරම්භ කළ ද විශේෂ අවස්ථාවල දි නිලඇඳුම් සපයා ගනු ලැබුවේ වෙනත් පාසල්වලිනි. එබැවින් ඔවුන්ට අවශ්‍ය නිසි ඇඳුම් ආයිත්තම් සපයා දීමට කටයුතු කරන ලදී.

**22.** **බාලක පෙරදිග තූර්ය වාදන බණ්ඩය ආරම්භ කිරීම**

ප්‍රථම වතාවට බාලක පෙරදිග තූර්ය වාදන බණ්ඩය ආරම්භ කරමින් සිසුන් පුහුණු කර විශේෂ අවස්ථා සඳහා යෙදවීමටත් තූර්ය වාදන බණ්ඩය සඳහා අවශ්‍ය උපාංග සළසා ගැනීමටත් කටයුතු කරන ලදී.

**23.** **උසස් පෙළ ශ්‍රේණි වෙත ඇතුලත් වන සිසුන්ට නායකත්ව සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම**

උසස් පෙළ වෙත ප්‍රවිශ්ට වන සිසුන් 600ක් සඳහා මෙම වැඩසටහන 2023.02.21 සිට 2023.02.24 දක්වා දින හතරක් පුරා පවත්වන ලදී. එහි දී සිසු ආකල්ප සංවර්ධනය සඳහා විශේෂ දේශන, සන්නිවේදනය හා චර්යා සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම්, බාහිර ආයතන නිරීක්ෂණය හා අධ්‍යයනය සඳහා අවස්ථා සැළසීම සහ යුධ හමුදා පුහුණු කණ්ඩායමක් විසින් පවත්වනු ලබන නායකත්ව හා පෞරුෂ සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සහිත වැඩසටහනක් ලෙස මෙය සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව අවසානයේ සිසුන්ට තම දක්ෂතා දැක්වීම සඳහා අවස්ථාව ද සපයා දෙන ලදී.





**24.** **‘පුංචි අපට දැන් තේරෙයි’ වේදිකා නාට්‍ය සිසුන් වෙත ප්‍රදර්ශනය කිරීම**

කලා උළෙල වැඩසටහන සඳහා බරපැන සපයා ගැනීමේ අරමුණින් ඉතා සාධාරණ මිලට සිසුන් වෙත මෙම වේදිකා නාට්‍ය 2023.01.05 දින ප්‍රදර්ශනය කරන ලදි. මෙම කාර්ය කලා සංගමය විසින් සංවිධානය කරන ලදී.

**25.** **කලා නිර්මාණ තරඟාවලිය පැවැත්වීම**

අවට පාසල් සිසුන් ද සම්බන්ධ කර ගනිමින් පද්‍ය, ගද්‍ය, සිතුවම්, සාහිත්‍ය අංශවල නිර්මාණ තරඟාවලියක් පවත්වන ලදී.

**26.** **‘පැහැසරණිය’ කලා උළෙල පැවැත්වීම**



වසර කිහිපයකට පසු කලා සංගමයේ සංවිධායකත්වයෙන් කලා නිර්මාණ රාශියක් සහිතව ‘පැහැසරණිය’ කලා උළෙල 2023.01.13 දින පවත්වන්නට යෙදුනි. මේ සඳහා ප්‍රධාන ආරාධිත දේශනය මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහතා වීසින් සිදු කරන ලදී.

## 27. බාලිකා බටහිර තූර්ය වාදන බණ්ඩය යලි ස්ථාපනය කිරීම

වසර ගණනාවකට පසු බාලිකා බටහිර තූර්ය වාදන බණ්ඩය නැවත පුහුණු කර, අවශ්‍ය ඇඳුම් ආයිත්තම් අළුතින් සකස් කර දී නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා සූදානම් කරන ලදී.



## 28. බාලදක්ෂිකාවන් සඳහා පදක්කම් ප්‍රදානය සඳහා පහසුකම් සැපයීම

බාලදක්ෂිකාවන් සඳහා පුහුණු කඳවුරුකිහිපයක්ම පාසලේ ඒ සම්බන්ධව කටයුතු කරන සහකාර විදුහල්පති චන්දිමා ජයතිලක මිය විසින් සිදු කරන අතර එම සිසුවියන් සඳහා පදක්කම් සහ සහතික ප්‍රදානය කිරීමේ උත්සවයක් ද පැවැත්වීය. මෙම කාර්යයන් සඳහා අවශ්‍ය පහසුකම් පළසා දෙන ලදී.

## 29. ඉංග්‍රීසි නාට්‍ය සඳහා සිසුන් යොමු කිරීම

මෙම කාර්යය සඳහා ප්‍රවේශයක් ලෙස ප්‍රවීන නාට්‍යවේදී ප්‍රියන්ත රත්නායක මහතාගේ සහ සෞන්දර්ය විශ්ව විද්‍යාල සිසුන්ගේ සහභාගිත්වයෙන් නාට්‍ය වැඩමුළුවක් පවත්වන ලදී.

## 30. පෙරවරු බුද්ධ පූජාව පැවැත්වීම

පෙරවරු ආගමික වතාවත්වලට සමගාමීව ප්‍රධාන බුදුමැදුරට බුද්ධ පූජාව රැගෙන යාම හේවිසි වාදනය සමඟ ඉතා ගෞරවාන්විතව සිදු කිරීම ආරම්භ කරන ලදී. පන්ති වෙත මෙම වගකීම බෙදා දීමට කටයුතු කරන අතර පන්සිල් සමාදන් වීමට ප්‍රථම මෙම පූජාව සිදු කිරීමට කටයුතු යොදා තිබේ.

## 31. වෙසක් පොහොය සැමරුම් වැඩසටහන් පැවැත්වීම

වසර ගණනාවකට පසු පෙරපෝය වැඩසටහන වෙසක් පොහොය අරමුණු කර ගනිමින් පවත්වන ලදී. ගුරුභවතුන් විසින් සව්කැඳ දන්සලක් සිසුන් වෙනුවෙන් සංවිධානය කරන ලදී. නියමිත සැලසුමකට අනුව වෙසක් කූඩු සකස් කර රැගෙන ඒමට සිසුන්ට අවස්ථාව ලබා දුන් අතර එම කූඩු පාසල ඉදිරිපිට ප්‍රදර්ශනය කර විදුලි බුබුලුවලින් ආලෝකමත් කරන ලදී. වෙසක් පොහොය දින පහන් ආලෝක පින්කමක් ද පවත්වන ලදී.

**32.** **සතිපාසල වැඩසටහන ආරම්භ කිරීම**

## ක්‍රීඩා කටයුතු

**33.** 6 – **9 ශ්‍රේණිවල සිසුන්ගේ ලැදියා/හැකියා අනුව විවිධ ක්‍රීඩා සඳහා තෝරා ගැනීමේ සැසි පැවැත්වීම**

මෙමඟින් එම ශ්‍රේණිවල සිසුන්ගෙන් ක්‍රීඩා නොකරන සිසුන් ක්‍රීඩාවන්ට යොමු කරගැනීමට හැකියාව ලැබුණු අතර එසේ තෝරාගත් සිසුන්ට පුහුණු වැඩසටහනක් පැවැත්වීමටත් කටයුතු කරන ලදී.

**34.** **සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම මඟින් නවක ක්‍රීඩා පුහුණුකරුවන් තෝරා ගැනීම**

චක්‍රලේඛ හා අධ්‍යාපන අමාත්‍යාංශ උපදෙස් ප්‍රකාරව පාසලෙහි ක්‍රීඩා සඳහා පුහුණුකරුවන් තෝරා ගැනීම ස්වාධීන මණ්ඩලයක් මඟින් සිදු කරන ලදී. ඒ අනුව වෙස්, බොක්ෂින්, මල්ලවපොර, කරාතේ වැනි ක්‍රීඩා සඳහා පුහුණුකරුවන් තෝරා ගන්නා ලදී.

**35.** **බොක්ෂින් හා මල්ලවපොර ක්‍රීඩා නැවත ස්ථාපනය කිරීම**

බොක්සිං ක්‍රීඩාව නැවත ස්ථාපිත කිරීම සඳහා පලපුරුදු ක්‍රීඩා භාර ආචාර්යවරයෙක් වන කරුණාතිලක මහතා පත් කර ආදි පුහුණුකරුවන් සමඟ නවක සිසුන් බඳවාගෙන පුහුණු කිරීම, දෙමාපියන් දැනුවත් කිරීම, ජාතික මට්ටමේ තරඟ සඳහා සිසුන් ඉදිරිපත් කිරීම ආදිය සිදු කරන ලදී. එහි ප්‍රතිපලයක් ලෙස පාසලට බොක්ෂින් ජයග්‍රහණ ලෙස ටී.බී.ජයා ශූරතාව, එල්.වී.ජයවීර ශූරතාව වැනි තරඟාවලිවල දී රන්, රිදී පදක්කම් හිමිකර ගැනීමට අප පාසලේ සිසුන්ට හැකියාව ලැබුණි.

**36.** **නිවාසාන්තර ක්‍රීඩා උළෙලට සමගාමීව බොක්ෂින් තරඟාවලියක් පැවැත්වීම**

**37.** **නිවාසාන්තර පිහිනුම් තරගාවලියක් ප්‍රථම වතාවට සංවිධානය කිරීම**

**38.** නිවාසාන්තර ක්‍රීඩා උළෙල උත්කර්ෂවත් අයුරින් පැවැත්වීම






**39.** ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් සඳහා සහභාගී වී රන් පදක්කම් ලැබූ සිසුන් වෙත විශේෂ පිළිගැනීම් හා ඇගයීම් අවස්ථා සංවිධානය කිරීම



**41.** **ආදි ශිෂ්‍යයන්ගේ පූර්ණ සහාය ඇතිව නව පැසි පන්දු පිටියක් සකස් කිරීම**



**42.** **නව ක්‍රීඩා ලෙස පැසි පන්දු, ඇරබික් ජිම්නාස්ටික්, බේස් බෝල්, සවි එසවීම හා රගර් යන ක්‍රීඩා ආරම්භ කිරීමට කටයුතු කිරීම**

සෑම සිසුවෙකුට ක්‍රීඩාවක් අනිවාර්ය කිරීම සමගම සිසුන්ට තම කැමැත්ත අනුව තෝරා ගැනීමට හැකි වන පරිදි ක්‍රීඩා වර්ග කිහිපයක් හඳුන්වා දීමට කටයුතු කරන ලදී. මෙම ක්‍රීඩා බොහොමයක් ක්‍රීඩකයින්ට පහසුවෙන් පළාත් තරඟ සඳහා සහභාගී වීමට හැකි වැඩි පාසල් සංඛ්‍යාවක ක්‍රියාත්මක නොවන ක්‍රීඩා වීම විශේෂත්වයකි.

## අධ්‍යාපන සංවර්ධනය හා ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම

**43.** **13 ශ්‍රේණියේ විද්‍යා, ගණිත හා වාණිජ සිසුන් සඳහා රාත්‍රී අධ්‍යයන පන්ති පැවැත්වීම**

රටේ පැවති තත්ත්වය හා පාසල් වසා තිබීම නිසා අ.පො.ස.උසස් පෙළ සඳහා 2022 වසරේ දී පෙනී සිටීමට නියමිතව සිටි සිසුන්ට පාසලෙන් ලැබිය යුතු අධ්‍යාපනය නිසි පරිදි නොලැබීම හේතුවෙන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවලට සහාය වීම පිණිස සවස 6.00 සිට රාත්‍රී 10.00 දක්වා රාත්‍රී අතිරේක පන්ති පවත්වන ලදී. මෙම පන්ති අතරතුර සිසුන්ට කෙටි ආහාර පාන පාසලෙන් ලබා දීමට ද කටයුතු කරන ලදී.

**44.** **12 ශ්‍රේණියේ ගුරුභවතුන්ගේ සහ 6-11 ශ්‍රේණිවල ගුරුභවතුන්ගේ ඉගැන්වීම පිළිබඳ පාසල් සිසුන් යොදා ගනිමින් ඇගයීමක් ප්‍රථම වතාවට සිදු කිරීම**

මෙවැනි ඇගයීමක් ප්‍රථම වතාවට පාසල තුළ සිදුකරන ලදී. එහි දී ගුරුවරුන්ගේ ඉගැන්වීම සම්බන්ධව සිසුන්ගේ අදහස් ලබාගත් අතර එම අදහස් අනුව කළ විශ්ලේෂණ සළකා ඉගැන්වීම් ගැටලු සහිත ගුරුභවතුන් පෞද්ගලිකව කැඳවා ඉදිරියේ දී ගුණාත්මක ඉගැන්වීමක් සඳහා සාකච්ඡා කරන ලදී.

**45.** **ගුරුවරුන් අභ්‍යන්තරව ඇගයීම සඳහා නව වැඩපිළිවෙලක් හඳුන්වා දීම**

'අපේ පාසල කොතරම් ගුණාත්මකද?' ඇගයීම් මාර්ගෝපදේශය ද සැලකිල්ලට ගනිමින් පාසලට අනන්‍ය ගුරු ඇගයීමේ ආකෘතියක් සකස් කරන ලදී. දර්ශක 20ක් එහි අඩංගු වන අතර ඉන් 10ක් පන්ති කාමරය තුළ ඉගැන්වීම නිරීක්ෂණයෙන් ලකුණු ලබා දීමට අදාළ දර්ශක වේ. අනෙක් දර්ශක 10 වෘත්තිකයෙකු ලෙස ගුරුවරයාගේ ගුණාත්මක බව ඇගයීමට අදාළ වේ.

**46.** **අ.පො.ස.සාමාන්‍ය පෙළ සිසුන්ට අමතර පන්ති පැවැත්වීම සහ ආදර්ශ පරීක්ෂණ පැවැත්වීම**

මේ සඳහා විශේෂ කාලසටහනක් සකස් කර මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන ලද අතර හර විෂයයන් සඳහා පැවැත්වූ ආදර්ශ පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර පරීක්ෂණ දිනයේ දී ම සිසුන් සමඟ සාකච්ඡා කරන ලදී.

**47.** **සිසුන් වාර පරීක්ෂණවල දී ලබන සාමාර්ථ අනුව ඇගයීමේ සුවිශේෂී වැඩපිළිවෙල**



මෙම ඇගයීම් වැඩපිළිවෙල තුළ පන්තියේ ඉහළම ලකුණු සාමාන්‍ය සහිත සිසුන් මෙන්ම පන්තියක පෙර වාරයට සාපේක්ෂව ලකුණු සාමාන්‍ය ප්‍රතිශතය ඉහළම මට්ටමින් වැඩි කර ගත් සිසුන්ට ඇගයීම් පදක්කම් පැලඳීම සිදු කරනු ලබයි. මෙම වැඩපිළිවෙල 2022 අධ්‍යයන වර්ෂයේ දෙවන වාරයට සාපේක්ෂව තුන්වන වාරයේ ලකුණු මත පදනම්ව ආරම්භ කරන ලදී.




**48.** **එළිමහන් පන්ති සකස් කිරීම**

පාසල් භූමියේ ස්වභාවය අනුව නිදහස් ඉගෙනුම් වාතාවරණයක් ඇති කිරීම සඳහා එළිමහන් පන්ති පරිශ්‍ර තුනක් ස්ථාපිත කරන ලදී.



**49. 9 ශ්‍රේණියේ සිසුන් සඳහා ලැදියා අනාවරණ පරීක්ෂණයක් සිදු කිරීම**

10 ශ්‍රේණියේ කාණ්ඩ විෂයයන් තෝරා ගැනීමේ දි සිසුන් විසින් කාණ්ඩයක විෂයයන් කිහිපයකින් එකක් හෝ දෙකක් විශේෂයෙන් තෝරා ගැනීමටත්, සමහර ජීවිතයට ප්‍රායෝගික වැදගත්කමක් සහිත විෂයයන් තෝරා නොගැනීමටත් ඇති ප්‍රවණතාව අවම කිරීම සඳහා මෙම අනාවරණ පරීක්ෂණය පවත්වන ලදි. ඒ තුළින් සිසුනගේ නිර්මාණශීලීත්වය හා එක් එක් විෂය සඳහා ඇති නැඹුරුව පරීක්ෂා කර තෝරා ගත යුතු කාණ්ඩ විෂය පිළිබඳ ඔවුන්ට උපදෙස් දීම සිදු කරන ලදී.

**50. සිසුන්ගේ සටහන් පොත් විධිමත්ව පවත්වාගෙන යාමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම**

සටහන් පොත් පවත්වා ගත යුතු ආකාරයට අදාළ නිර්ණායක සිසුන් වෙත ලබා දුන් අතර එය නියාමනය කිරීම සඳහා ගුරුවරුන්ට උපදෙස් දෙන ලදී.

**51. 2021 අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාගයේ දී විශිෂ්ට සාමාර්ථ 9ක් ලබා ගත් සිසුන් ඇගයීම**

**52. 2021 අ.පො.ස. උසස් පෙළ විභාගයේ දි විශිෂ්ට සාමාර්ථ 3ක් ලැබූ සිසුන් සහ විශිෂ්ට සාමාර්ථ 2ක් අධිසාමාර්ථයක් සමගින් ලබා ගත් සිසුන් ඇගයීම**

**53. උසස් පෙළ විද්‍යා අංශයේ ඉගැන්වීම් සිදු කිරීමේ දී නම්‍යශීලී කාලසටහනක් භාවිත කිරීම**

මිනිත්තු 40 කාලච්ඡේද ඉගැන්වීමෙන් විෂය නිර්දේශ ආවරණය කිරීම සහ සැලසුම් කළ පරිදි දෛනික පාඩම් සටහන් ක්‍රියාත්මක කිරීම අසීරු බැවින් එක් විෂයයක් සඳහා දිනකට කාලච්ඡේද 4ක් දක්වා යොදාගත හැකි වන පරිදි නම්‍යශීලී කිරීමට අවස්ථාව සළසා දෙන ලදී.

**54. 6 ශ්‍රේණියට බඳවා ගන්නා සිසුන් සඳහා නව ඉංග්‍රීසි ව්‍යාපාතියක් ආරම්භ කිරීම**


චාතුර්විධ ඉංග්‍රීසි භාෂා කුසලතා සිසුන් තුළ ඇති කිරීම සඳහා 6 ශ්‍රේණියේ සිට ආරම්භ කරන ඉංග්‍රීසි පාඨමාලාව පාසල් විෂය නිර්දේශයට සමගාමීව ක්‍රියාත්මක කිරීම සිදු වේ. ඒ මඟින් සන්නිවේදන කුසලතා මෙන්ම පෞරුෂ සංවර්ධනය සඳහා ද ක්‍රියාකාරකම් සිදු කෙරේ.





55. ගුරු ඌනතා පැවති සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපන, භෞතික විද්‍යා, බටහිර සංගීතය, තොරතුරු තාක්ෂණ (ඉංග්‍රීසි මාධ්‍ය) වැනි විෂයයන් සඳහා ගුරුවරුන් ලබා ගැනීමට කටයුතු කිරීම

56. උසස් පෙළ තාක්ෂණ අංශයේ **BEIZAS** අධ්‍යාපනික ප්‍රදර්ශනය පැවැත්වීම








57. උසස් පෙළ විද්‍යා අංශයෙන් පෙනී සිටින සිසුන් සඳහා ප්‍රායෝගික පරික්ෂණ වැඩමුළුවක් පැවැත්වීම





## ශිෂ්‍ය සුබසාධන කටයුතු

**58.** **පාසල තුළ උපදේශන වැඩපිළිවෙල ශක්තිමත් කිරීම**

උපදේශන අංශය වෙත පුහුණු සංවර්ධන නිලධාරිනියක් පත්කළ අතර ඇය සායනික පුහුණුව සඳහා ද යොමු කර ශිෂ්‍ය ගැටලු හඳුනා ගැනීමට හැකි පරිසරය නිර්මාණය කරන ලදී. ගැටලු සහිත සිසුන් හඳුනාගෙන පාසල් මට්ටමෙන් අවශ්‍ය උපදේශනය සැපයීම හාඅවශ්‍යතාව අනුව සිසුන් වෛද්‍යවරුන් කරා යොමු කිරීමට පියවර ගැනේ.

**59.** **සිසුන් පාසලට රැගෙන එන පාසල් වෑන් රථ හා බස් රථවල රියදුරු මහතුන් කැඳවා සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධව දැනුවත් කිරීම**

**60.** **12 ශ්‍රේණියේ සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය පිළිබඳව ඔවුන්ගේ දෙමව්පියන් සමඟ සාකච්ඡා කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම**

වාර විභාග ලකුණු අනුව සාධන මට්ටම අඩු සිසුන් ඔවුන්ගේ දෙමව්පියන් සමඟ කැඳවා සාකච්ඡා කර සිසුන්ගේ නිවෙස් පරිසරය අධ්‍යයන කටයුතු සඳහා උචිත පරිදි සකස් කර ගැනීමට මගපෙන්වීම සිදු කරමින් පවතී.

**61.** **නව යොවුන් සිසුන්ට පවතින ගැටලු පිළිබඳ සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සිසුන් දැනුවත් කිරීම**

මෙම වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රජා සෞඛ්‍ය ඒකකයෙහි විශේෂඥ වෛද්‍ය උත්පලා අමරසිංහ මහත්මිය විසින් අවස්ථා දෙකක දි සිදු කරන ලදී.



**62.** **ශිෂ්‍ය ඉතුරුම් ප්‍රවර්ධනය සඳහා මහජන බැංකුව සමඟ කටයුතු කිරිම**

දීර්ඝ කාලයක් අක්‍රීයව පැවති විද්‍යාලයීය මහජන බැංකු ඉතුරුම් ඒකකය අලුත්වැඩියා කර 6 - 9 ශ්‍රේණි වල සිසුන්ගේ ඉතිරිකිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා නව මුහුණුවරකින් ආරම්භ කර එය 2022.10.03 දින විවෘත කරන ලදී.

**63.** ආපන ශාලාව විවෘත කර සිසු අයිතියට පත් කිරීම

අලුත්වැඩියා කටයුතු මන්දගාමීව සිදුවෙමින් පැවති ආපන ශාලාව ඉක්මනින් නැවත විවෘත කිරිමට කටයුතු කළ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව එහි සැපයුම්කරුවන් ද ලියාපදිංචි කර ගිවිසුම්ගතව පවත්වාගෙන යාමට භාර දෙන ලදී.

**64.** සමාජ මාධ්‍ය යොදා ගැනීම පිළිබඳ වැඩසටහනක් පැවැත්වීම

සමාජ මාධ්‍ය ඵලදායීව භාවිතය සම්බන්ධයෙන් විද්‍යාලයේ 10 හා 11 ශ්‍රේණි වල සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ප්‍රවීන දේශක අමිත ගමගේ මහතාගේ සම්පත් දායකත්වයෙන් පැවැත්වූ අතර මේ සඳහා පාසලේ ආදි ශිෂ්‍ය සංගමය විසින් අනුග්‍රහය දක්වන ලදී.

**65.** දියණි උපදේශන වැඩසටහන් පැවැත්වීම

8, 9 සහ 10, 11 ශ්‍රේණිවල ශිෂ්‍යයාවන් සඳහා නව යොවුන්වියේ අභියෝග හා ඉන් ආරක්ෂා වීම, සෞඛ්‍ය සම්පන්නව ජීවත් වීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් අයේෂා සඳගිරි මහත්මියගේ සම්පත් දායකත්වයෙන් පැවැත්වීමටත්, 6 හා 7 ශ්‍රේණි වල ශිෂ්‍යයාවන් සඳහා විශේෂ උපදේශන වැඩසටහනක් ප්‍රසාදි නිසංසලා මෙනවියගේ මෙහෙයවීමෙන් සිදුකිරීමටත් කටයුතු කරන ලදී.

**66.** පුතුන් සඳහා පෞරුෂ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

6, 7 සහ 8, 9 ශ්‍රේණිවල පුතුන් වෙනුවෙන් නායකත්ව පුහුණු වැඩසටහනක් පාසලේ ආචාර්ය මේජර් කරුණාතිලක මහතාගේ සම්පත් දායකත්වයෙන් පැවැත්විය. මීට අමතරව 10, 11 ශ්‍රේණිවල පුතුන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ දැනුවත් කිරීමේ වැඩසටහන් ගම්පහ කොට්ඨාස සහකාර පොලිස් අධිකාරීගේ සම්පත්දායකත්වයෙන් පවත්වන ලදී.

67. බත් බැංකුව වැඩසටහන

දෛනිකව විද්‍යාලයට පැමිණෙන සිසු සිසුවියන් වැඩි දෙනෙක් නිරාහාරව පාසල් කාලය තුළ අධ්‍යයය කටයුතුවල නිරත වන බව පෙනී ගොස් ඇත. පාසලට පැමිණෙන විට අමතර ආහාර පාර්සලයක් රැගෙන ඒමට සිසුන් යොමු කර ඒම ආහාර පාර්සල ආහාර නොමැති සිසුන්ට ලබා දීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී.

**68.** සිසුන්ගේ වැසිකිලිවල පහසුකම් පුළුල් කිරිම හා වැසිකිලි පිරිසිදු කිරීම විධිමත් කිරීම

**69.** ආර්ථික අපහසුතා සහිත සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම

ආර්ථික අපහසුතා සහිත සිසුන් තෝරාගෙන 6 ශ්‍රේණියේ සිසුන් 6ක් සහ 11 ශ්‍රේණියේ සිසුන් 8ක් සඳහා ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ආදි ශිෂ්‍යයන්ගේ සහයෝගයෙන් මාසික දීමනාවක් ලෙස රු.5000ක් බැගින් ලබා දීම සිදු වේ.

**70.** ආර්ථික අපහසුතා සහිත සිසුන්ට පාසල් උපකරණ බෙදා දීම

6, 7, 8 සහ 9 ශ්‍රේණිවල තෝරාගත් සිසුන් 180 ක් සඳහා 2023 අධ්‍යයන වර්ෂයට අවශ්‍ය රු.5000කට වැඩි වටිනාකමින් යුත් පාසල් උපකරණ ආදී ශිෂ්‍ය සංගමයේ අනුග්‍රහය මත ලබා දෙන ලදී.

**71.** **ඩෙංගු රෝගය බෝවීම වැලැක්වීමට කටයුතු කිරීම**

පාසල් පරිශ්‍රයෙහි මදුරුවන් බෝවිය හැකි ස්ථාන ඉවත් කිරීම සහ පාසලට පොලිතින් වර්ග ගෙන ඒම සාපුරා තහනම් කිරීම හා එය නියාමනය කිරීම මෙන්ම පාසල් පරිශ්‍රය දූමායනය කිරීම සිදු කරන ලදී. තව ද ඩෙංගු රෝග බෝවීම වැලැක්වීම පිණිස මීරිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සමග සම්බන්ධ කර ගනිමින් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ද සිදු කෙරේ.

**72.** **සිසුන්ගේ ආහාර ගැනීමේ ක්‍රමය විධිමත් කිරීම සඳහා කෑම පෙට්ටිය හැන්ද සහ කෝප්පය රැගෙන ඒම අනිවාර්ය කිරීම**

## ගුරු හා කාර්යමණ්ඩල සුබසාධන කටයුතු

**73.** **පාසල් කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන හා කුසලතා ඉදිරිපත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම**

අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන වැඩසටහනක් 2022.10.24 දින පැවැත්වූ අතර විවිධ ක්‍රියාකාරකම් මඟින් කාර්ය මණ්ඩලය අතර සුහදත්වය ඇති කිරීමට පියවර ගන්නා ලදී. මේ සඳහා මහාචාර්ය එම්. තිලකසිරි මහතාගේ සම්පත් දායකත්වය ලබා දෙන ලදී. එය අවසානයේ සියළුදෙනාගේම සහභාගිත්වයෙන් කාර්ය මණ්ඩල සෞන්දර්යාත්මක කුසලතා ඉදිරිපත් කිරීමක් ද සිදු කරන ලදී.

**74.** **සෞඛ්‍යමත් ජීවන රටාවක් පිළිබඳ පාසලේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම**

බෝ නොවන රෝග සහ සෞඛ්‍යමත් ජීවන රටාවක් පිළිබඳ පාසලේ පාසලේ අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022-9-7 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂඥ වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මියගේ සම්පත් දායකත්වයෙන් පැවැත්විය.

**75.** **ගුරු විවේකාගාර සඳහා අවශ්‍ය අල්මාරි සහ උපකරණ සපයා දීම**

**76.** **ගුරු සුබසාධනය සඳහා අතිරේක මුදලක් තැම්පත් කිරීම**

දැනට අසනීපයෙන් සිටින ගුරුමහත්මීන් දෙපලක් සඳහා ඖෂධ ලබා දීමට කාර්ය මණ්ඩලය විසින් එකතු කළ මුදල් එම ගුරුභවතුන්ට ලබා දුන්න ද ඒවා පාසලේ සිසුන්ගේ හෝ කාර්ය මණ්ඩලයේ සුබසාධනය උදෙසා ලබා දෙන ලෙස දන්වමින් නැවත පාසල වෙත භාර දුන් බැවින් එම මුදල් සුබසාධන ගිණුම්ගත කර ඉදිරි අවශ්‍යතාවක් සඳහා යොදා ගැනීමට අවස්ථාව සළසා දෙන ලදී.

**77.** **සුබසාධන සංගමයේ මූල්‍ය ප්‍රවර්ධනය සඳහා අවස්ථා ලබා දීම**

පාසල් සුබසාධක සංගමය වෙත මුල්‍ය ප්‍රවර්ධනය පිණිස ගෘහ උපකරණ හා භාණ්ඩ සල්පිල් පැවැත්වීමටත්, සිසුන්ගේ ක්‍රීඩා ඇඳුම් මසා විකිනීමටත්, විශේෂ අවස්ථාවල දී ආහාරපාන විකිණීමටත් අවස්ථා සළසා දෙන ලදි. ශීතකරණයක් සුබසාධන සංගමය වෙත මිලදී ගැනීම සඳහා ද සුබපතන්නන්ගේ අනුග්‍රහය ලබා ගැනීමට අවශ්‍ය සබඳතා ඇති කර දෙන ලදී.

## භෞතික සම්පත් සංවර්ධනය

**78.** **පරිගණක, මල්ටිමීඩියා උපකරණ අළුත්වැඩියා කර නැවත සිසු පරිහරණයට ලබා දීම**

කල් ඉකුත් වී භාවිත නොකර තිබුණු පරිගණක 22ක් අධ්‍යාපන අමාත්‍යාංශ තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ලබා ගෙන අළුත්වැඩියා කළ අතර භාවිතයෙන් ඉවත් කර තිබුණු Boxlight වර්ගයේ වටිනා මල්ටිමීඩියා උපකරණය පාසල් මුදලින් අළුත්වැඩියා කර සිසු පරිහරණයට ලබා දීමට කටයුතු කරන ලදී.

**79.** **පරිගණක විද්‍යාගාර සඳහා නව UPS උපකරණ 25ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ ශාඛාවෙන් ලබා ගැනීමට කටයුතු කිරීම**

**80.** **පරිගණක විද්‍යාගාරවලට නව වායුසමීකරණ යන්ත්‍ර සවි කිරීම**

**81.** **සංගීත හා නැටුම් විෂයයන්ට අදාළ භාණ්ඩ අළුත්වැඩියා කිරීම**

පියානෝවක් ඇතුළු පාසලේ සංගීත අංශයේ භාවිතයෙන් ඉවත්ව තිබූ සංගීත හා නැටුම් භාණ්ඩ රාශියක් රු. 450,000 ක පමණ මුදලක් වැය කරමින් අළුත්වැඩියා කිරීම සිදු කරන ලදී. පාසලේ හිටපු ගුරුවරයෙකු තම පෞද්ගලික පරිහරණයට රැගෙන ගොස් තිබුණු පාසලට අහිමි වීමට ගිය සංගීත උපකරණ නැවත ලබා ගැනීම සඳහා කටයුතු කළ අතර ඒවා ද අළුත්වැඩියා කර ලබා ගන්නා ලදී. මෙම භාණ්ඩවල ආරක්ෂාව සඳහා යකඩ අල්මාරි ද සපයා දෙන ලදී.

**82.** **වැසිකිළිවල අපජලය බැසයාමේ පද්ධතිය නවීකරණය කිරීම**

**83.** **පන්ති කාමරවල ගෙබිම අළුත්වැඩියා කිරීම**

**84.** **ප්‍රධාන ගොඩනැගිල්ලෙහි වහල සහ කොන්ක්‍රීට් පියස්ස අළුත්වැඩියා කටයුතු සිදු කිරීම**

**85.** **ආරක්ෂිත කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීම**

**86.** **බෝධීන් වහන්සේ වටා පවුර ප්‍රතිසංස්කරණය කිරීම හා වැලි මළුව සැකසීම**



**87.** බටහිර තූර්ය වාදන ශිෂ්‍ය හට බණ්ඩය සඳහාත්, ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහාත්, ශිෂ්‍ය හටවි බණ්ඩය සඳහාත් ඔවුන්ගේ කටයුතු සඳහා නව ස්ථාන වෙන්කර දීම



**88. 10** ශ්‍රේණි පන්ති විදුලි ආලෝකකරණය කර දීම සහ එම පන්තිවලට විදුලි පංකා සවිකර දීම

**89.** මාර්ග ආරක්ෂණ උපකරණ කට්ටලයක් සියැට් ආයතනය සමඟ සාකච්ඡා කර ලබා ගැනීම

**90.** නියෝජ්‍ය විදුහල්පතිනිය සඳහා නිල කාමරය නැවත සකස් කර දීම

**91.** වාණිජ අංශයේ සුහුරු පන්ති කාමරය පුළුල් කර 150කට වැඩි පිරිසකට එකවර අසුන්ගත හැකි වන පරිදි ශ්‍රවණාගාර ශාලාවක් ලෙස සකස් කිරීම

**92.** ප්‍රධාන ශාලාව සඳහා අවශ්‍ය ශබ්ධ විකාශන පද්ධති, ආලෝක පද්ධති හා කුෂන් පුටු ආදි ශිෂ්‍ය කණ්ඩායම් සමඟ සාකච්ඡා කර ලබා ගැනීමට කටයුතු කිරීම

**93.** සිසු නායකත්ව සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය අංගෝපාංග ස්ථාපනය කිරීම
පාසල් භූමිය තුළ ස්ථාපනය කර තිබූ එළිමහන් පුහුණු සහ ක්‍රියාකාරකම් සඳහා වන අංගෝපාංග නවීකරණය කරමින් නව අංගෝපාංග ද ඊට එකතු කරන ලදී. එළිමහන් පුහුණු වීම් සඳහා අප පාසලේ සිසුන්ට මෙන්ම වෙනත් පාසල්වල සිසුන්ට ද යොදාගත හැකි පරිදි මෙම භූමිය සකස් කරන ලදී. එම අංග යොදා ගනිමින් පාසල තුළ නායකත්ව සංවර්ධන වැඩසටහන් ද පවත්වන ලදී.

**94.** පාසල් ගොඩනැගිලි වෙත මාර්ග නම් කිරීමේ පුවරු සකස් කර ස්ථාපනය කිරීමට කටයුතු කිරීම

**95.** පාසලේ වෙබ් අඩවිය සකස් කිරීම

**96.** පාසල් ඩිජිටල් තොරතුරු පද්ධතිය හා තොරතුරු දත්ත පාදකය (Digital App and Database) සකස් කිරීමට කටයුතු කිරීම

**97.** පාසල් බස් රථය නවීකරණය කර භාවිතයට යෙදවීම

**98.** පාසලේ කැඩී ඇති යකඩ ඩෙස්ක් පුටු අළුත්වැඩියා කිරීම හා නව ඩෙස්ක් 30ක් මිල දී ගැනීම

## ප්‍රජා සබඳතා

**99.** ආදි ශිෂ්‍ය සංගමයේ දායකත්වයෙන් නව ජෙනරේටරයක් පාසලට ලබා දීම



**100.** මුව ආවරණ හා අත්සේදුම් දියර තොගයක් පරිත්‍යාග කිරීම




කොරෝනා වසංගත තත්ත්වය පහව ගිය ද සිසුන්ගේ ආරක්ෂාව උදෙසා MAS Active Linea Intimo ආයතනය විසින් පාසලේ සියලුම සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා මුව ආවරණ හා අත් සේදුම් දියර තොගයක් පරිත්‍යාග කරන ලදී.

**101.** අවශ්‍ය බේස් ඩ්‍රම් උපකරණයක් ලබා දීම

බටහිර තූර්ය වාදන කණ්ඩායමට අවශ්‍ය බේස් ඩ්‍රම් උපකරණයක් එක්සත් රාජධානියෙන් ආනයනය කර ලබා දීමට ආදි ශිෂ්‍යයන් විසින් කටයුතු කරන ලදී.



**102. 9 ශ්‍රේණියේ පිරිමි සිසුන් සඳහා ආහාර සැකසුම් වැඩමුළුවක් පැවැත්වීම**

ගෘහ ආර්ථික විද්‍යාව කාණ්ඩ විෂයයක් ලෙස 10 ශ්‍රේණියේ දී තෝරා ගැනීම සඳහා සිසුන් යොමු කිරීමේ අරමුණින් අබාන්ස් ආයතනයේ අනුග්‍රහයෙන් මෙම වැඩමුළුව පවත්වන ලදී. එම ආයතනය මඟින් ගෘහ ආර්ථික විද්‍යා අංශයට අවශ්‍ය උපකරණ කිහිපයක් ද පරිත්‍යාග ලදී.

**103. ඉලක්කයට වෙඩි තැබීමේ ක්‍රීඩාවට අදාළව වායු රයිෆලයක් හා පිස්තෝල 2ක් ආදි ශිෂ්‍ය සංගමය විසින් පරිත්‍යාග කරන ලදී.**

**104. පැල රෝපනය කිරීම**

1995 ආදි ශිෂ්‍ය කණ්ඩායමේ සත්කාරයක් ලෙස පාසල් භූමියෙහි ඇත්වෙරියා පැල සියයක් රෝපනය කරන ලදී. තව ද පළතුරු පැල පාසල් භූමියෙහි රෝපනය කිරීමේ වැඩපිළිවෙලක් ද ආරම්භ කර ඇත.

**105. ආදි සිසුන් නැවත පාසලට සම්බන්ධ කර ගැනීම**

පාසලෙන් තරමක් දුරස්ව සිටි ආදි සිසුන්ට පාසලේ සංවර්ධනය සඳහා දායක වීමට සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන ලදී. Back to School වැනි වැඩසටහන් පැවැත්වීමට අවස්ථාව සළසමින් පාසල් ආදි සිසුන් ඒකරාශී කරගැනීමට කටයුතු කරන ලදී. Back to School මඟින් උත්පාදනය කළ මුදල් පාසලෙහි පැසි පන්දු පිටියක් ඉදි කිරීම සඳහා යොදා ගන්නා ලදී.

**106. 'රන් මගක හිරු කිරණ' නමින් පාසලේ පැරණි ක්‍රීඩා ගුරුවරුන් ඇගයීමේ වැඩසටහනක් පැවැත්වීමට ආදි සිසුන්ට අවස්ථාව ලබා දීම**

**107. Central Premier League නමින් වාර්ෂිකව පවත්වන ආදි ශිෂ්‍ය ක්‍රිකට් තරඟාවලිය පාසල් ක්‍රීඩා පිටියෙහි පැවැත්වීමට අවස්ථාව ලබා දීම**

මෙම ක්‍රිකට් තරඟාවලිය මඟින් උපයාගත් මුදලින් රු.600,000ක මුදලක් පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල වෙත ලබා දීමට ආදිසිසුන් විසින් කටයුතු කරන ලදී.

**108. ගමට ක්‍රීඩා වැඩසටහන සඳහා අත්තනගල්ල කොට්ඨාසයේ පාසල් 17ක් සම්බන්ධකර ගැනීම හා සිසුන්ට අවස්ථාව ලබා දීම**



**109.** **අධ්‍යාපන පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨතම ශිෂ්‍ය භට නිලධාරියා වෙනුවෙන් උත්තමාචාර පැවැත්වීම**




ජාතික ශිෂ්‍ය භට බලකායේ අධ්‍යාපන පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු ලෙස සිට විශ්‍රාමලත් කර්නල් දයා බණ්ඩාර මහත්මා හට ජාතික ශිෂ්‍යභට බලකායේ හරසර උපහාර දැක්වීමේ උත්සවයක් පැවැත්වූ අතර ඒ සඳහා අප පාසලේ සත්කාරකත්වය සළසා දෙන ලදී.

**110.** **ජාතික ශිෂ්‍යභට බලකාය සඳහා පාසලේ සහයෝගය ලබා දීම**

ජාතික ශිෂ්‍ය භට බලකාය සමඟ සමීප සම්බන්ධතා පවත්වමින් 7 වන බලැණියේ වර්ණ ප්‍රදානෝත්සවය පැවැත්වීමට පාසල් සත්කාරකත්වය ලබා දීම සහ ශිෂ්‍ය භට ලාංඡන සකස්කර ගැනීමට පාසලේ සහාය ලබා දීම සිදු කරන ලදී.

**111.** **නායකත්ව පුහුණු වැඩසටහන්, බොක්ෂින් පුහුණු වීම් සහ ශිෂ්‍ය භට පුහුණු පැවැත්වීම සඳහා වෙනත් විද්‍යාල වෙත පාසල් පරිශ්‍රය හා පහසුකම් ලබා දීම**

**112.** **වෙනත් පාසල්වල ශිෂ්‍ය සාධන වැඩසටහන් සඳහා අපගේ පාසලේ ගුරුභවතුන් එම පාසල්වල ඉල්ලීම මත සම්පත්දායකයන් ලෙස සහභාගී වීමට අවස්ථාව සැලසීම**

## 2023 වර්ෂය අවසන් වීමට පෙර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්

1. බාලිකා නේවාසිකාගාරය විවෘත කිරීම
2. සුබපත්නන් සම්බන්ධ කර ගනිමින් නව බස් රථයක් පාසල වෙත ලබා ගැනීම
3. විදුහල්පති සඳහා නිල රථයක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ භාවිත කරන ලද ජීප් රථයක් අළුත්වැඩියා කර භාවිත කිරීම සඳහා ලබා ගැනීම
4. පාසල් ඩිජිටල් තොරතුරු පද්ධතිය හා තොරතුරු දත්ත පාදකය (Digital App and Database) හඳුන්වා දීම
5. පාසල් භූමියේ වදුරව ක්‍රීඩාංගනය සමීපයේ කැඩී ඇති වැට පිලිසකර කිරීම
6. කලකට ඉහත වැඩ ආරම්භ කර අතහැර දමා ඇති පන්ති කාමර ගොඩනැගිල්ල යොදා ගනිමින් නව පන්තිකාමර දෙකක් සකස් කිරීම
7. පෙල පොත් ආරක්ෂිතව ගබඩා කිරීම සඳහා පහසුකම් සකස් කිරීම
8. කාර්යාලයේ අභ්‍යන්තර අළුත්වැඩියා හා දියුණුකිරීම් සිදු කිරීම

